GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

මාධ්‍ය නිවේදනය

09.03.2012

**ජාතික ඖෂධ ප්‍රතිපත්තියක අවශ්‍යතාවය**

මහාචාර්ය සේනක බිබිලේ විසින් ලොවට හඳුන්වා දෙනු ලැබූ දියුණුවෙමින් පවත්නා රටවල රෝගී ජනතාවට ප්‍රමිතියෙන් යුතු බෙහෙත් අඩු මිලට සැපයීමේ "අත්‍යවශ්‍ය ඖෂධ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය අන් කවරදාටත් වඩා අද ඉස්මතු වී ඇත.

මෙයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ දිනෙන් දින ඉහළ යන ඖෂධ මිලත් වැඩිවන ජීවන වියදමත් යන අන්ත දෙකෙන් අද රෝගියා දැඩි ලෙස පීඩාවට පත්වී සිටීමයි. මෙහිදී රෝගී ජීවිත රැකගැනීමේ සත්කාරයේ යෙදී සිටින අපගේ සාමාජිකත්වය අවම මිල සහිත උපරිම ගුණාත්මකභාවයෙන් යුතු ඖෂධ රෝගියා අතට පත්කිරීම සඳහා සැමවිටම කටයුතු කරන බවත්, රෝහල් තුළ ඖෂධ තොග හිඟයකින් තොරව පවත්වාගෙන යාමේ වගකීම අදාළ බලධරයන්ගෙන් ඉටුවේයැයි බලාපොරොත්තු වන බවත් රටේ මහ ජනතාව වෙත දන්වනු කැමැත්තෙමු.

ස්තූතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර : | වෛද්‍ය නලින් ආරියරත්න | 0714800942 |
| | වෛද්‍ය නවීන් ද සොයිසා | 0718582444 |